# ප්‍රාග් ඓතිහාසික යුගයේ පළඳනා නිර්මාණය කිරීම සඳහා සත්ත්ව අවශේෂවල භාවිතය

පී. එම්. සකුනි යශෝධා හතරසිංහ[1], කේ. චන්දිම වනිගතුංග[2], එන්. එම්. චමින්ද බණ්ඩාර[3], එස්. ඒ. උමා සචින්දිනී දිසානායක[4]

[1]පුරාවිද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. sakuni.hatharasinghe@gmail.com
[2]ධීවර සහ සමුද්‍ර ජීවවිද්‍යා පීඨය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය. 33chandima@gmail.com
[3]පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය. chamindanm@gmail.com
[4]පුරාජෛවවිවිධත්ව ඩිප්ලෝමා පාඨමාලාව- 2015, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.
umadissanayake@gmail.com

ප්‍රමුඛ පද- ප්‍රාග් ඓතිහාසික යුගය, පළඳනා, සත්ත්ව අවශේෂ, පුරාජෛවවිවිධත්වය, තාක්ෂණය.

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සන්දර්භවලින් හමුවන සාධක අතර පළඳනා වැදගත් වේ. කාල නිර්ණ අනුව අදින් වසර 125,000 ක් පමණ ඉතිහාසයක් සහිත මෙරට ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සාධක අතර මානව අවශේෂ, සත්ත්ව අවශේෂ, මෙවලම්, පළඳනා ආදිය වේ. මෙයින් පළඳනා නිර්මාණය කිරීම කෙරෙහි ප්‍රාග් ඓතිහාසික මානවයා යොමුවීමෙන් ඔවුන් තුළ ක්‍රමිකව වර්ධනය වූ ප්‍රජානනාත්මක සහ සංජානනාත්මක හැකියාවන් පෙන්නුම් කෙරේ. මෙම පළඳනා නිර්මාණය කිරීම සඳහා බොහෝවිට සත්තව අස්ථි සහ දත් වැනි අමුද්‍රව්‍යය භාවිත කර ඇති බව කුරුවිට බටදොඹ ලෙන, කිතුල්ගල බෙලි ලෙන, අලවල පොත්ගුල් ලෙන, බුලත්සිංහල ෆාහියන් ලෙන ආදී ප්‍රාග් ඓතිහාසික ක්ෂේත්‍රවලින් හමු වී ඇති පළඳනා අනුව පැහැදිලි වේ.

## ක්‍රමවේදය


මෙම පර්යේෂණය සඳහා ක්ෂේත්‍ර පර්යේෂණවලින් දැනට සොයාගෙන ඇති පළඳනා අධ්‍යයනය කිරීම මූලිකව ම සිදු කෙරේ. එහි දී එකී පළඳනා හමු වූ ප්‍රාග් ඓතිහාසික ක්ෂේත්‍රය සහ ඒ අවට වත්මන් පාරිසරික පසුබිම මූලිකව ම අධ්‍යයනයට ලක් කෙරේ. එම ක්ෂේත්‍රයන්ගේ වත්මන් පාරිසරික තත්ත්වයන් සහ හමුවන ප්‍රාග් ඓතිහාසික සත්ත්ව අවශේෂ මගින් එම ප්‍රදේශයේ ප්‍රාග් ඓතිහාසික යුගයේ පැවති පුරාජෛවවිවිධත්වය සහ පළඳනා නිර්මාණය කිරීම සඳහා භාවිත කරන ලද සත්ත්ව අවශේෂවල උපයෝගීතාව සඳහා වූ සම්භාවිතාව පැරණි පාරිසරික තත්ත්වයන් සමග බලපාන ලද ආකාරය අධ්‍යයනය කරනු ලැබේ. එම සත්ත්ව අවශේෂ, පළඳනා නිර්මාණයට යොදාගැනීම සඳහා මුල් වූ කරුණු මෙහි දී පර්යේෂණයට ලක් කෙරේ. මේ සඳහා පර්යේෂණාගාර අධ්‍යයන, ක්ෂේත්‍ර පර්යේෂණ, සංසන්දනාත්මක අධ්‍යයන යන අධ්‍යයන ක්‍රමවේදයන් භාවිත කරන ලදී.

මෙම පර්යේෂණයේ දී පර්යේෂණ ක්ෂේත්‍රය පහතරට තෙත් කලාපීය ගුහාවලට සීමා කරනු ලැබේ. මෙහි දී කුරුවිට බටදොඹ ලෙන, කිතුල්ගල බෙලි ලෙන, බුලත්සිංහල ෆාහියන් ලෙන සහ අලවල පොත්ගුල් ලෙන යන ප්‍රාග් ඓතිහාසික සාධක හමුවන පහතරට

තෙත් කලාපීය ගුහා ක්ෂේත්‍රවලට පර්යේෂණයේ ක්ෂේත්‍රය සීමා කෙරේ.


## ප්‍රතිඵල සහ සාකච්ඡාව

මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ක්ෂේත්‍රවලින් හමුවන සත්ත්ව අස්ථිවලින් නිර්මිත පළඳනා පිළිබඳව සාකච්ඡා කරනු ලැබේ. මෙම පළඳනා නිර්මාණය කිරීමට භාවිත කර ඇති අස්ථි අවශේෂ අයත් වන සත්ත්ව විශේෂ පිළිබඳ ප්‍රථමයෙන් අධ්‍යයනය කරනු ලබයි. ක්ෂීරපායී, පක්ෂි, මත්ස්‍ය සහ මෘද්වංශික යන සත්ත්ව කාණ්ඩවලට අයත් සතුන්ගේ අස්ථි, කවච, දත් සහ අං ආදිය යොදාගනිමින් මෙම පළඳනා නිර්මාණය කර ඇත. එකිනෙක ප්‍රාග් ඓතිහාසික ගුහා ක්ෂේත්‍රවලින් හමුවන සත්ත්ව අස්ථිවලින් නිර්මිත පළඳනා මගින් එම ක්ෂේත්‍රය අවට ප්‍රාග් ඓතිහාසික යුගයේ පැවති පුරාණ පරිසර තත්ත්වයන්, පුරාණ දේශගුණය සහ පුරාජෛවවිවිධත්වය පිළිබඳව අධ්‍යයනය කළ හැකි ය. එම පුරාජෛවවිවිධත්ව පසුබිම, වත්මන් ජෛවවිවිධත්වය සමග සංසන්දනාත්මක විග්‍රහයන් ඔස්සේ අධ්‍යයනය කිරීමට ඉන් අවකාශය සැලසෙයි. එමගින් එම ක්ෂේත්‍ර අවට පරිසරයේ අතීත සහ වර්තමාන වෙනස්කම් සහ විකාශනයන් පර්යේෂණයට ලක් කළ හැකි ය.



කුරුවිට බටදොඹ ලෙන පරිශ්‍රයෙන් හමු වී ඇති කරදිය සහ මිරිදිය බෙල්ලන්ගේ කවචවලින් නිර්මිත පබළු.

පළඳනා නිර්මාණය සඳහා යොදාගත් සත්ත්ව අවශේෂ අනුව ප්‍රාග් ඓතිහාසික මානවයා සබඳතා පැවැත්වූ සත්ත්ව විශේෂ පිළිබඳව සාධක සොයාගත හැකි වේ. තවද මෙම ප්‍රාග් ඓතිහාසික ක්ෂේත්‍රවලින් හමුවන සත්ත්ව අවශේෂවලින් නිර්මිත පළඳනා අතර කරදිය පරිසර පද්ධතිවලින් හමුවන මත්ස්‍ය සහ මෘද්වංශික සත්ත්ව විශේෂවලට අයත් සත්ත්ව අවශේෂවලින් නිර්මිත පළඳනා ද වේ. මේ අතර මෝර දත් සහ කරදිය බෙල්ලන් විශේෂවලට අයත් කවචවලින් නිර්මිත පළඳනා දැකිය හැකි ය. ඒ අනුව මෙම පහතරට තෙත් කලාපීය ගුහාවල වාසය කළ ප්‍රාග් ඓතිහාසික මානවයා වෙරළබඩ ප්‍රදේශය සහ සාගරය සමග සම්බන්ධතා පැවැත්වූ බව පැහැදිලි වේ. මෙම සත්ත්ව අවශේෂ හෝ සත්ත්ව අවශේෂවලින් නිර්මිත පළඳනා, වෙරළබඩ වාසය කළ ප්‍රාග් ඓතිහාසික මානවයින් සමග පැවැත්වූ අන්තර් සබඳතා හෝ සෘජුව වෙරළබඩ ප්‍රදේශවලට ගොස් ලබාගැනීම මගින් පහතරට තෙත් කලාපීය ගුහාවාසී ප්‍රාග් ඓතිහාසික මානවයින් අත්පත් කරගත්තේ ද යන්න අධ්‍යයනය කළ




අලවල පොත්ගුල් ලෙනෙන් (වම) සහ බුලත්සිංහල ෆාහියන් ලෙනෙන් (දකුණ හමු වී ඇති මෝර දත්වලින් නිර්මිත පළඳනා.

යුතුව ඇත.

මෙම පළඳනා මගින් ප්‍රාග් ඓතිහාසික මානවයා තුළ පැවති නිර්මාණශීලී විභවතා සහ තාක්ෂණික ශිල්පීය කුසලතා ද නිරූපණය කෙරේ. විශේෂයෙන් ම එම සත්ත්ව අවශේෂ ඔප දැමීමට, සිදුරු විදීමට, උරච්චි කිරීමට ආදි මානවයින් උපයෝගී කරගත් තාක්ෂණික ක්‍රමෝපායන් මෙහි ලා වැදගත් වේ. ඒ සඳහා මෙවලම් භාවිත කර ඇත්තේ කුමන ආකාරයෙන් ද යන කරුණ මෙහි දී ප්‍රමුඛ වේ. පළඳනා නිර්මාණයට සුදුසු

සත්ත්ව අවශේෂ මොනවාද යන්න පිළිබඳව වූ සහජ ඥානය, ඒ සඳහා යොදාගත් සත්ත්ව විශේෂ සහ සත්ත්ව අවශේෂවල විවිධත්වය අනුව එකී මානවයින්ගේ ප්‍රජානනාත්මක සහ සංජානනාත්මක වර්ධනය පිළිඹිබු කෙරේ. එයින් ප්‍රාග් ඓතිහාසික මානවයා සමාජ සත්ත්වයෙක් වශයෙන් අත්පත් කරගත්තා වූ ද්‍රව්‍යමය සංස්කෘතියේ වර්ධනය පෙන්නුම් කරනු ලැබේ. ප්‍රාග් ඓතිහාසික මානවයා සහ එම සත්ත්ව විශේෂ අතර පැවති අන්‍යෝන්‍ය සම්බන්ධතාව ද මෙම පළඳනා මගින් එළිදැක් වේ.



කිතුල්ගල බෙලි ලෙන පරිශ්‍රයෙන් හමු වී ඇති ගෝනෙකුගේ (*Rusa unicolor*) උරච්චි කරන ලද කෘන්තක දතක්.

මෙම පළඳනාවල උපයෝගීතාව ද අධ්‍යයනය කරනු ලබයි. මෙම පළඳනා භාවිත කර ඇත්තේ හුදෙක් ශරීර අලංකරණය සහ පෞද්ගලික සැරසිලි සඳහා පමණක් ද, නැතහොත් යම් අභිචාරමය අවස්ථාවක් හෝ අභිචාරයක් අධ්‍යයනය කළ යුතු වේ. මෙම පළඳනාවල සමාජ භාවිතය ද මෙමගින් අධ්‍යයනය කළ හැකි වේ. මෙහි දී මෙම පළඳනා පැළඳීම සිදුකර ඇත්තේ යම් නායකත්ව හෝ අධ්‍යාත්මික අධිකාරියක් පමණක් ද යන්න වැදගත් කරුණක් වේ. මෙම පළඳනා භාවිතයේ දී පුම්තිරිභාවය (ස්ත්‍රී- පුරුෂභාවය) අනුව යම් යම් වෙනස්කම් පැවතියේ ද යන්න ද අධ්‍යයනයට පාත්‍ර කළ යුතු කරුණකි. නමුත් මේ පිළිබඳව මෙතෙක් හමු වී ඇති සාධක ප්‍රමාණාත්මකව අවම මට්ටමක පැවතීම නිසා මෙම කරුණු අධ්‍යයනය කිරීම අපහසු වේ.

මෙම පර්යේෂණය මගින් පහතරට තෙත් කලාපීය ගුහාවාසී ප්‍රාග් ඓතිහාසික මානවයා විසින් සත්ත්ව අවශේෂ යොදාගෙන නිර්මාණය කර ඇති පළඳනා ආශ්‍රයෙන් ඒ සඳහා යොදාගත් සත්ත්ව විශේෂ, තාක්ෂණය සහ ශිල්පීය ක්‍රම, එම පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍ර ආශ්‍රිත අතීත පාරිසරික තත්ත්වයන් සහ සත්ත්ව වරණය, පළඳනාවල උපයෝගීතාව සහ එහි ස්වභාවයන් ආදිය පිළිබඳව සංසන්දනාත්මක සහ විචාරාත්මක අධ්‍යයනයක් සිදුකිරීම මූලික අරමුණ වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


දැරණියගල, එස්. යූ. (1991) ***ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය;*** පරිවර්තනය. ජයවර්ධන, එස්, පෙරේරා එච්.එච්. කොළඹ 07: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

මනමේන්ද්‍ර-ආරච්චි, කේ. එන්., අදිකාරි, ජී. (2014) ***අනුරාධපුර පුරාජෛවවිවිධත්වය සහ වර්තමාන ජෛවවිවිධත්වය.*** ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය, බත්තරමුල්ල, පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය.

මනමේන්ද්‍ර-ආරච්චි, කේ. එන්., අදිකාරි, ජී. (2012) ***ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සත්ත්ව අවශේෂයන්ගෙන් නිර්මිත සුවිශේෂී නිර්මාණයන්.*** ආචාර්ය පී.ඊ.පී. දැරණියගල 39 වන ගුණානුස්මරණය වෙනුවෙන් පැවැත්වෙන පුරාජෛවවිවිධත්ව සමුළුව - පර්යේෂණ ලිපි සහ තොරතුරු පත්‍රිකා, බත්තරමුල්ල, ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යාංශය.